ලැබිය යුතු දෑ	16	9,022,496.95	4,166,068.37
මුදල් හා මුදල්	17	2,032,746.98	2,928,138.96
මුළු වත්කම්		**113,904,593.18**	**80,659,692.53**
වගකීම්			
වත්මන් වගකීම්			
ජංගම වගකීම්	18	1,200,000.00	452,000.00
කළින් ලැබීම්	19	1,678,703.52	2,652,580.68
උපචිත වියදම	23	**1,602,002.50**	1,373,327.50
		4,480,706.02	**4,477,908.18**
මුළු ශුද්ධ වත්කම්		**109,423,887.16**	**76,181,784.35**
ශුද්ධ වත්කම් / ස්කන්ධ			
සමුච්චිත අරමුදල			
2022.01.01 දිනට ඉදිරියට ගෙනා ශේෂය		76,181,784.35	54,919,918.83
පෙර වර්ෂ සඳහා ගැලපුම්	20	56,038.10	(2,668,841.71)
2022.01.01 දිනට ගැලපූ ශේෂය		76,237,822.45	52,251,077.12
භාණ්ඩාගාර ප්‍රධානය			
ප්‍රාග්ධන ප්‍රතිපූර්ණය		2,936,334.69	1,000,000.00
සූනිසි මෙහෙවර යටතේ			9,821,279.15
Revaluation Reserves (තක්සේරු)		11,375,590.00	
වර්ෂය සඳහා අතිරික්තය / හිඟය		18,874,140.02	13,109,428.08
		109,423,887.16	**76,181,784.35**

පිටු 07 සහ 09 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 10 සිට 36 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසක් වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඔවුන් වෙනුවෙන් අත්සන් කරනු ලැබ ඇත.

Lankika Weerasinghe
Accountant
National Institute of Labour Studies
02nd Floor, Labour Secretariat,
Narahenpita, Colombo 05.

ලංකිකා විරසිංහ
ගණකාධිකාරී

B.K. Prabath Chandrakeerthi
(Attorney-at-Law)
Commissioner General of Labour
Department of Labour
Colombo 05.

බී.කේ ප්‍රභාත් චන්ද්‍රකීර්ති
උපසභාපති

W.M.D. Suranga Gunarathne
Director General
National Institute of Labour Studies
2nd Floor, Labour Secretariat
Narahenpita, Colombo 05

ඩබ්.එම්.ඩී සුරංග ගුණරත්න
අධ්‍යක්ෂ ජනරාල්

R P A Wimalaweera
Secretary
Ministry of Labour and Foreign Employment
7th Floor, "Mehewara Piyesa"
Narahenpita, Colombo 05.

ආර්.පී.ඒ. විමලවීර
සභාපති

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය / (හිඟය)		18,874,140.02	13,109,428.08
ගැලපීම්			
ක්ෂය වීම්	11	3,263,669.50	1,406,568.12
ස්ථාවර තැන්පතුවලින් ආයෝජන ආදායම	22	(8,225,306.97)	(2,532,852.53)
Loss on Disposal (භාණ්ඩ අපහරණය)		536,848.70	**386,776.56**
විශ්‍රාම පහසුකම්	23	228,675.00	**316,482.50**
Non cash Adjustment – Fixed Deposit Interest	20	8,934.33	
කාරක ප්‍රාග්ධන ගාස්තුවලට පෙර මෙහෙයුම් ලාභය		**14,686,960.58**	**12,686,402.73**
Increase/Descrease in Working Capital			
තොග (වැඩි වීම) / අඩු වීම	15	145,813.95	280,180.91
ලැබිය යුතු දෑ (වැඩි වීම) / අඩු වීම	21	(149,212.46)	(1,752,505.41)
මුදල් අත්තිකාරම්වල (වැඩි වීම) / අඩු වීම	18	748,000.00	(1,166,086.25)
උපචිත වීම් (වැඩි වීම) / අඩු වීම	19	(973,877.16)	(3,427,311.26)
විශ්‍රාම පහසුකම්	23		**1,056,845.00**
පෙර වර්ෂවල ගැලපීම්	20	**56,038.10**	**(2,668,841.71)**
පෙර වර්ෂයට ගැලපීම් (අපහරණය / දේපළ / ස්ථාවර වත්කම්)			**1,924,207.64**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**14,513,723.01**	**6,932,891.65**
Finance cost		-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**14,513,723.01**	**6,932,891.65**
ස්ථාවර තැන්පතු ආයෝජනය		-	-
ආයෝජන ක්‍රියාකරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ			
දේපල යන්ත්‍ර හා භාණ්ඩ අපහරණය	14.1	(3,595,449.68)	(10,821,279.15)
ස්ථාවර තැන්පතු ආයෝජනය	22	(14,750,000.00)	(14,500,000.00)
මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**(18,345,449.68)**	**(25,321,279.15)**
Cash Flows from Financing Activities			
Treasury Grant - Capital		2,936,334.69	10,821,279.15
Net Cash Flow from Financing Activities		**2,936,334.69**	**10,821,279.15**
මුදල් හා සමාන දෑ ශුද්ධ (වැඩි වීම)/ අඩු වීම		**(895,391.98)**	**(7,567,108.35)**
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ	17	**2,928,138.96**	**10,495,247.31**
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ	**17**	**2,032,746.98**	**2,928,138.96**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.4.1 ආයතන තොරතුරු

3.4.1.1 මූලික හැඳින්වීම

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අධ්‍යාපන අංශය ප්‍රතිව්‍යුහගත කරමින් කම්කරු විෂය භාර අමාත්‍යාංශය යටතේ 2007 වර්ෂයේ සැප්තැම්බර් හිදී පිහිටුවන ලද මෙම ආයතනය 2010 අංක 12 දරණ පනත බලාත්මක කිරීම ඔස්සේ පාර්ලිමේන්තුව විසින් නීත්‍යානුකූලව ස්ථාපිත කරන ලදී. මෙම පනතට අනුකූලව සේවා යෝජකයින්, වෘත්තීය සමිති සහ රාජ්‍ය නිලධාරීන් නියෝජනය කරමින් සේවාදායකයින් ඇතුළු කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශවීය කොටස්කරුවන්ගේ නියෝජිතයින්ගෙන් සමන්විත පාලක මණ්ඩලයක් විසින් ආයතනය පාලනය කරනු ලැබේ. වර්තමානයේදී මෙම ආයතනය දෙවැනි මහල, කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05 ලිපිනයේ පිහිටා ඇත.

3.4.1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වාභාවය

කම්කරු නීතිය සහ කාර්මික සබඳතා විෂය ක්ෂේත්‍රයට අදාළව විවිධ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීම, වැඩපොළ ඵලදායීතාවය ඉහළ නැංවීම සහ ප්‍රකාශන කටයුතු සිදු කිරීම ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූලික ක්‍රියාකාරකම් ලෙස දැක්විය හැක.

3.4.1.3 ආයතන කාර්ය මණ්ඩලය

2007 සැප්තැම්බර් මාසයේ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කළද, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ සේවක සංඛ්‍යාව අනුමත කිරීම 2014 මාර්තු මාසයේදී සිදු වී ඇත. මෙම පසුබිම යටතේ කම්කරු අමාත්‍යාංශය සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් ආයතනය වෙත මෙහෙයුම් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර ඇති අතර එම නිලධාරීන්ගේ වැටුප් අදාළ ආයතන විසින් ගෙවා ඇත. එම නිසා මෙම මූල්‍ය ප්‍රකාශයේ සඳහන් සේවක පිරිස් සඳහා වේතන සහ වැටුප් දීමනා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මෙන්ම කම්කරු අමාත්‍යාංශය සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලැබේ.

3.4.1.4 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය කළමණාකරණය

ආයතනයේ මූලාරම්භයේ සිට 2011 සැප්තැම්බර් 30 වන දින දක්වා ආයතනයේ මූල්‍ය කළමණාකරණය කම්කරු අමාත්‍යාංශය විසින් සිදුකර ඇත. (කාර්ය මණ්ඩලය සහ වෙනත් බාධක හේතුවෙන්)

3.4.2. පිළියෙළ කිරීමේ පදනම

3.4.2.1 අනුකූලතා ප්‍රකාශනය

ජාතික ශ්‍රම අධ්‍යයනයේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශය සඳහා වූ සටහන්වලින් සමන්විත වෙයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නියම කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුව මෙම ප්‍රකාශයන් පිළියෙළ කරන ලදී.

3.4.2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙළ කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශයනයන්ගේ උද්ධමනීය කාරණාවන් සඳහා ගැලපීම් සිදුකර නැත.

3.4.2.3 පවතින ව්‍යාපාර

පවතින ව්‍යාපාරයක් ලෙස පවත්වා ගැනීමට ඇති හැකියාව ස්ථාපිත කිරීමේ තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් විසින් සිදුකර ඇති අතර ඔවුන් විසින් ඈවර කිරීමට හෝ වෙළඳ කටයුතු අවසන් කිරීමට අදහස් නොකරයි.

3.4.2.4 සංසන්දනාත්මක තොරතුරු

ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් නිරන්තරව යාවත්කාලීන කරමින් භාවිත කරන අතර එම නිසා පසුගිය වර්ෂයේ භාවිතා කළ ඒවා සමග ඒවා අනුකූල නොවෙයි. පවත්නා (වර්තමාන) වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවකදී පමණක් පසුගිය වර්ෂයේ දත්ත තොරතුරු සහ ප්‍රකාශන නැවත සකස් කර භාවිතයට ගනු ලැබේ.

3.4.2.5 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මෙම මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබේ.

3.4.2.6 සැලකිලිමත් විය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේදයන් සඳහා අනුකූලව යොදවා ඇත.

3.4.3.1 දේපළ, පිරියත සහ උපකරණ

වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා එහි වැඩ කරන තත්ත්වයට ගෙන ඒමේදී සිදු වූ යම් යම් වියදම් සමඟ එන අත්පත් කරගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයයි. පිරිවැයේදී වත්කමක් ලෙස මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, නැවත අගය කරන ලද වත්කම් එයින් ඇතිවන කිසියම් ක්ෂය වීමක් අඩු කිරීමෙන් අනතුරුව නැවත අගය කරන ලද ප්‍රමාණයෙන් ගෙනයනු ලබයි. අනෙකුත් සියලුම වත්කම්, පිරියත සහ උපකරණවල සමුච්චිත ක්ෂය අඩුකර පිරිවැය සඳහන් කරනු ලැබේ. වෙනස් භාවිතයට ගත හැකි ජීවන කාලයක් පවතින ප්‍රධාන උපාංගවලින් පිරියත සහ උපකරණ අයිතමයක් සමන්විත වන අවස්ථාවන්හීදී, එම දේපළ, පිරියත සහ උපකරණවල වෙනම අයිතමයක් ලෙස ගණනය කරනු ලැබේ. සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම අවශ්‍ය පරිදි වත්කම් අවශේෂ වටිනාකම, ප්‍රයෝජනවත් කාලයට වැඩියෙන් පිරිවැය කපා හැරීම සඳහා සින්නක්කර ඉඩම්වලට වඩා සියලුම දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය අයකරනු ලැබේ. බැහැර දිය හැකි දිනය දක්වා භාවිතය සඳහා වත්කම් ලබාගත හැකි දිනයන් ක්ෂය වීම් ලබා දී ඇත. තවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 7 SLPSAS 7 දේපළ පිරියත හා උපකරණහි විස්තර කර ඇති පරිදි පිරියත හා උපකරණ පිරිවැය ක්‍රමයට ගණනය කර ඇති බව පහත දක්වා ඇති පරිදි සරල රේඛීය ක්‍රමයක් මත පිරියත හා උපකරණ ක්ෂය ගණනය කරනු ලැබේ.

භාවිත කරන ලද මූලික වාර්ෂික අනුපාත පහත පරිදි වේ.

3.4. වාර්ෂික අනුපාත

	2022
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වර්ෂ 10
ලී භාණ්ඩ සහ උපකරණ	වර්ෂ 13 (7.5%)
පරිගණක	වර්ෂ 10
නාම පුවරු හා වෙනත්	වර්ෂ 03
පොත් පත්	වර්ෂ 05

2013.10.02 දිනට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දේපළ, පිරියත හා උපකරණ නැවත තක්සේරු කර ඇති අතර 2014.01.07 දින අදාළ වාර්තාව නිකුත් කර ඇත.

3.4.3.2 තොග (Inventory)

මූල්‍ය වර්ෂය තුළ භාවිතා කරන ලද බඩු වට්ටෝරු පිරිවැයේදී ආදායම් සහ වියදම් ප්‍රකාශනය සඳහා අය කර තිබේ.

3.4.3.3 මුදල සහ සම වටිනාකම

මුදල් සහ සම වටිනාකම්, අතැති මුදල් හා බැංකුවල තැන්පත් කරන මුදල්වලින් සමන්විත වෙයි.

3.4.3.4 වගකීම සහ විධිවිධාන

අතීත සිද්ධීන්ගේ ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් පවතින විට ශේෂ පත්‍රය තුළ වගකීම හඳුනාගනු ලැබේ. ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් පිටතට ගලායෑමක් එහි නිරවුල් කරලීමෙන් අපේක්ෂා කරනු ලබයි. ණයකරුවෙකුගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍ර දිනයෙන් වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු බැඳීම සලකනු ලබන්නේ ශේෂ පත්‍රයේ වර්තමාන වගකීම් ලෙසය. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස, විශ්වාසනීය ලෙස තක්සේරු කළ හැකි වර්තමාන නෛතික හෝ අනුමත බඳවා ගැනීමක් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සඳහා ඇත්නම් ප්‍රතිපාදන හඳුනාගනු ලබන අතර බැඳීම් නිරවුල් කරගැනීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යෑමක් අවශ්‍ය බවට නිශ්චය කළ හැකි වේ.

3.4.3.5 ආදායම හඳුනාගැනීම

භාණ්ඩ ලබා දී පවරා ඇති අවස්ථාවක භාණ්ඩ / සේවාවන්ගේ අලෙවියෙන් ආදායම හඳුනාගනු ලැබේ. සලකා බලන ලද ලැබීම් සහ ලැබිය හැකි සාධාරණ වටිනාකම්, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් එකතු කරගත් බදු ආශ්‍රිත අඩු කිරීම් හා අලෙවි කිරීම් දළ වශයෙන් ආදායමක් දක්වනු ලැබේ.

ආදායම් පදනම

පාඨමාලාවලට සහභාගීවන්නන් සඳහා ගෙවීම් සිදුකිරීමේදී උපචිත පදනම මත ආදායම් ගණනය කරනු ලැබේ. නොවැලැක්විය හැකි හේතූන් නිසා සමහර සහභාගීවන්නන් විසින් නියමිත කාලය සම්පූර්ණ කිරීමට පෙර පාඨමාලාව අත්හරිනු ලබන අතර විවිධ හේතූන් නිසා ඇතැම් පාඨමාලා ගාස්තූන් අයකරගත නොහැකිය. මෙම ලැබීම් ආදායමක් ලෙස සලකා බලා නොමැත. කෙසේවෙතත්, වීවැනි අවස්ථාවලදී හැකිනම් ඉතිරි ප්‍රමාණය අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. පාඨමාලාවේ සමස්ත ආදායම තීරණය කරනු ලබන්නේ පාඨමාලාවේ වර්ෂය සඳහාය.

3.4.3.6 ලැබීම්

සෘණාත්මක සහ සැක සහිත ලැබීම් සඳහා දළ දීමනා වටහා ගැනීමට තක්සේරු කර ඇති බවට වෙළඳ ලැබීම් ප්‍රමාණයන්ගෙන් සටහන් කරන ලදී. අදාළ පාර්ශවයන්ගෙන් වෙනත් ලැබීම් හා අයවීම් අයහපත් සහ සැක සහිත ලැබීම් සඳහා දීමනාවන් පිරිවැයෙන් අඩු කරනු ලබයි.

3.4.3.7 අර්ථ දක්වන ලද දායක මුදල් සැලසුම්

නිර්වචනය කරන ලද දායක මුදල් සැලැස්මක් යනුවෙන් අදහස් කරන්නේ වෙනම කොටසකට ස්ථාවර දායක මුදල් ගෙවන කොටසක් යටතේ වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැලැස්මක් වන අතර වැඩිපුර ප්‍රමාණයක් ගෙවීම සඳහා නෛතික හෝ අනුමිත බැඳීමක් නොමැත. සෑම සේවකයෙක්ම ආවරණය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදලට දායක වීම සඳහා වූ බැඳීම් සිදුවූ පාඩු හෝ ලාභ වියදම් ලෙස හඳුනාගනු

ලැබේ. අර්ථසාධක අරමුදල් සහ භාරකාර අරමුදල් ලෙස සේවකයන්ගේ දළ වේතනයෙන් 12% සහ 3%ක් වශයෙන් පිළිවෙලින් සමාගම දායක මුදල් ගෙවයි.

3.4.3.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව SLPSAS මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත.

හතරවන පරිච්ඡේදය

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. LSW/B/NILS/SR/01/2022 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 29 දින

සභාපති

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න,
විගණකාධිපති

පිටපත : 1. ලේකම්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය.
2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොළුවල පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. LSW/B/NILS/SR/01/2022 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 මැයි 19 දින

සභාපති
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.5 ට අනුව භාණ්ඩ බෙදාහැරීම සහ හිමිකම මාරු වූ විට භාණ්ඩ/සේවා අලෙවියෙන් ලැබෙන ආදායම හඳුනා ගැනෙන බව දක්වා තිබුණද, ව්‍යාපාර කළමණාකරණය සිංහල හා දෙමළ ඩිප්ලෝමාව සම්බන්ධව සිදුකළ නියැදි පරීක්ෂාවේදී මොඩියුල අවසන් කිරීම මත පදනම වෙනුවට මුදල් ලැබෙන අවස්ථාවේදී ආදායම හඳුනාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය රු.204,000 ක් වැඩියෙන් දැක්වුණි.

(ආ) ව්‍යාපාර කළමනාකරණ සිංහල ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශිෂ්‍යයෙකුගෙන් ආයතනයට රු.56,000 ක මුදලක් වර්ෂය තුල ලැබී තිබුණි. මෙම පාඨමාලාවට අයත් මොඩියුල 12 න් එකක් පමණක් යථෝක්ත වර්ෂයේදී අවසන් කර ඇති නමුත් සම්පූර්ණ පාඨමාලා ගාස්තුව ආදායම් ලෙස හඳුනාගැනීම නිසා වාර්ෂික ලාභය රු.52,000 කින් වැඩියෙන් දැක්වුණි.

(ඇ) ව්‍යාපාර කළමණාකරණ සිංහල ඩිප්ලෝමාව සඳහා සමාලෝචිත වර්ෂයේදී අයදුම්කරුවන් 5 දෙනෙකුගෙන් ලද රු.20,000 ක මුදල ආදායම් ලෙස හඳුනා නොගැනීම නිසා ලාභය අඩුවෙන් දැක්වුණි.

(ඈ) 2020 මූල්‍ය වර්ෂය සඳහා විගණන ගාස්තුව රු.162,200 ක් එම වර්ෂයේදී ප්‍රතිපාදනය නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට ආයතනයේ කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කල යුතුය. තවදුරටත් නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුලත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැඩීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන

පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ 16 (1) උපවගන්තිය	මේ පනත යටතේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය තාක්ෂණික කමිටු යම් සංඛ්‍යාවක් මණ්ඩලය විසින් පත්කරනු ලැබිය හැකි වුවද ඊට අනකූලව එවැනි කමිටු පත්කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් කරුණු හැර ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත	
(i) 3 (ඈ) උපවගන්තිය	පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම ආයතනයේ එක් ප්‍රධාන අරමුණක් වුවත් 2023 මාර්තු 31 දින දක්වා එවැනි පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවාවක් ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.
(ii) 3 (ඉ) උපවගන්තිය	සමාන අරමුණු සහිත ජාතික හා විදේශීය ආයතන සංවිධාන සංගම් සහ සමිති සමඟ සමීප සහයෝගීතාවයෙන් කටයුතු කිරීම සිදු කලයුතු වුවද එවැනි වැඩසටහන් විධිමත් ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.
(iii) 4 (උ) උපවගන්තිය	ආයතනයේ අරමුණුවලට සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සමාන අරමුණු සහිත, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පිහිටි වෙනත් ආයතන සමඟ පුද්ගලයන් හුවමාරු කර ගැනීම හා පුහුණු කිරීම, පර්යේෂණ හා උපදේශක සේවා පිළිබඳ සහ සාමාන්‍යයෙන් ඔවුනොවුන්ගේ පොදු අරමුණු ඉදිරියට ගෙන යාම පිණිස විය හැකි යම් කාර්ය සඳහා ගිවිසුම්වලට ඇතුලත් වීම සිදුකල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

2.3 වෙනත් කරුණු

(අ) බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට අනුව අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ස්ථිර තනතුරක් පවතී. එය ආයතනයේ පරිපාලනය සම්බන්ධයෙන් සමස්ත වගකීම සහ වගවීම සහිත ඉහළම විධායක සාමාජික තනතුර වන අතර මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට ආයතනය මේ දක්වා කටයුතු කර නොතිබුණි. විභාග අංශයේ වැඩසටහන් නිලධාරී සහ සහකාර අධ්‍යක්ෂක තනතුරු සඳහා නිලධාරීන් බඳවා නොගැනීමෙන් විධිමත් පරිදි රාජකාරි ඉටු නොවන බව නිරීක්ෂණය විය.

(ආ) ආයතනය ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2020 ජූලි මාසයේදී පර්යේෂණ ප්‍රකාශන හා ව්‍යාපෘති අංශයක් ස්ථාපිත කර තිබුණද විගණිත දින දක්වා විධිමත් ලෙස නිලධාරියෙකු සේවයේ යොදවා නොමැති බැවින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම ගැටලු සහගත විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
தேசிய தொழில் கற்கைகள் நிறுவகம்
National Institute of Labour Studies

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින ස්ථාපිත කරන ලද අතර 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් බලාත්මක කරන ලදී. කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෙපාර්ශව හවුල්කරුවන් වන සේවය, සේවක හා රජයේ සේවකයින්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මඟින් පාලනය වේ. කම්කරු අණපනත්, නීති රීති රෙගුලාසි පිළිබඳව දැනුවත්, ඵලදායී ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුහුණු හා පර්යේෂණ කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම ආයතනයේ මූලික කාර්යභාරයයි.

தேசிய தொழில் கற்கைகள் நிறுவகமானது, தொழில் அமைச்சின் அதிகாரத்தின் கீழ் வருகின்ற நியதிச்சட்ட அமைப்பொன்றாகும். இந்த நிறுவகம், 2007 செப்ரெம்பர் 11 ஆம் திகதி தாபிக்கப்பட்டிருந்ததுடன், 2010 ஆம் ஆண்டின் 12 ஆம் இலக்க தேசிய தொழில் கற்கைகள் சட்டத்தினால் வலுப்படுத்தப்பட்டிருந்தது. இந்த நிறுவகம், முத்தரப்பு அக்கறைதாரர்களான தொழில்தருநர்கள், பணியாளர்கள் மற்றும் அரச அலுவலர்களைக் கொண்ட ஆளுநர் சபையினால் நிருவகிக்கப்படுகின்றது. இந்நிறுவகத்தின் பிரதான பணி, தொழில் சட்டங்கள், கட்டளைச்சட்டங்கள், சட்டங்கள், விதிகள் மற்றும் ஒழுங்குவிதிகள் பற்றி அறிந்துள்ள பயனுறுதிவாய்ந்த, ஆக்கத்திறனுள்ள தொழில் அணியொன்றை உருவாக்குவதற்குத் தேவையான பயிற்சி மற்றும் ஆய்வு நடவடிக்கைகளை வடிவமைப்பதும், நடைமுறைப்படுத்துவதுமாகும்,

The National Institute of Labour Studies is a statutory body functioning under the Ministry of Labor. This Institute was established on 11 September 2007 and was empowered by the National Institute of Labour Studies Act No. 12 of 2010. This Institute is governed by a governing body consisting of the tripartite partners, the employers, the employees and the public servants. The primary role of this Institute is to design and implement the training and research activities required to create an effective and productive workforce that is aware of labour Acts, Ordinance, laws, rules and regulations.

2 වන මහල, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05.
2 ஆவது தளம் தொழில் செயலகம், கொழும்பு 05.
2nd Floor, Labour Secretariat, Colombo 5.

Tel : 0112 786541/ 0112 786548 | Email : admin@nils.gov.lk | Web : www.nils.gov.lk

PRINTEC | 0112 815 816